සැඟවුණු විජේවීර පවුලට රැකවරණ දුන් දොස්තර මහත්තයා කියන කතාව

මේ ඉල් මහ විරුවන් සමරන සමයයි. ඉකුත් 13 වැනිදා ජවිපෙ නායකයා මෙන්ම එම පක්ෂයේ නිර්මාතෘ වූ රෝහණ විජේවීර ඝාතනය කළ දිනයයි. ඒ දිනය මුල් කරගෙන ජනතා විමුක්ති පෙරමුණ එහි නිර්මාතෘන් සැමරීම ඉකුත් වසර ගණනාවේදීම සිදුකරනු ලැබීය. මේ ලිපිය ඉල් මහ විරු සමරුව නිමිත්තෙනි.

ජවිපෙ නායක රෝහණ විජේවීරයන් රහසිගතව ජීවත් වූ සමයේ ඔහු ආගිය තැන් සැඟව සිටි තැන් දැන සිටි තැනැත්තා මෙන්ම ඔහුගේ හා පවුලේ වෛද්‍යවරයා ද වූ විටෙක ඔවුන්ගේ ගමන් සගයා ද ආරක්ෂකයා ද සේ සිටි වෛද්‍ය වසන්ත බණ්ඩාර 'මොනරා' හා බෙදාගත් අතීත අත්දැකීම් මෙසේ පෙළගස්වන්නෙමු.

කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් පේරාදෙණිය වෛද්‍ය පීඨයට වසන්ත බණ්ඩාර තරුණයා තේරෙන විටත් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙකි. ඔහු වසර තුනක්ම වෛද්‍ය විද්‍යාලයීය ස්වාධීන ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයාව සිටියේය. වෛද්‍ය වසන්ත බණ්ඩාර පේරාදෙණි විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයෙන් පිටව තරුණ වෛද්‍යවරයකු ලෙස කොළඹ ජාතික රෝහලට (එවකට කොළඹ මහරෝහලට) ආවේ තම පශ්චාත් උපාධිය සම්පූර්ණ කර ගැනීමට කොළඹ සියලු පහසුකම් ඇති නිසාය. ඒ වන විටත් ඔහු ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරී සාමාජිකයෙකි. එහෙත් ඔහු සිය අධ්‍යාපනය අතහැරියේ හෝ රැකියාව අතහැරියේ නැත. කොළඹ දී නිතර ජවිපෙට සම්බන්ධ විද්වතුන් එක්ව කරන කතාබහේ දී අනිවාර්ය තිදෙනෙක් වූයේ ආචාර්ය අතුල සුමතිපාල, වෛද්‍ය වසන්ත හා සෝමවංශ අමරසිංහය. මේ කතාබහට පහසු වෙන්නට වසන්ත කොළඹින් ගෙයක් කුලියට ගත්තේය. සෝමවංශ ද එහි නැවතිණි. මේ නිවෙසේ නිතර පැවැති දේශපාලන විද්වත් කතාවන්ට නායක රෝහණ ද ආවේ ගියේය. මේ නිසා වසන්ත හා සෝමවංශ අතර ඇති සමීපතාව වැනි සමීප බවක් ජවිපෙ නායකයා හා වසන්ත අතර ද ඇති විය.

මේ ආසන්න සමයක එනම් 1983 දී ජනතා විමුක්ති පෙරමුණ තහනමට ලක්විය. ඒ ඔවුන් තවදුරටත් සමීප කරන සිදුවීමක්ම විය. විජේවීර සැඟවිණි. ඔහු කොළඹින් ඉවත්ව බණ්ඩාරවෙල වල්හපුතැන්නට ගියේය. සෝමවංශ, වසන්ත බණ්ඩාර අමතා කීවේ ඔහු ද ජවිපෙ නායකයා සමග බණ්ඩාරවෙලට යා යුතු බවය.

"මේ වෙලාවේ විජේවීර සහෝදරයා වෙනුවෙන් කැපවෙන්න පුළුවන් කෙනෙක්, රහස් රහස් විදියටම රකින්න පුළුවන් කෙනෙක්ට ඉන්නේ සහෝදරයා විතරයි. නායක සහෝදරයා වෙනුවෙන් ජීවිතය වුණත් දෙන්න පුළුවන් කෙනෙක්ට ඉන්නේ ඔබයි. ඔබත් එහි යායුතුයි.'' කියල සෝමවංශ සහෝදරයා කිව්වා. මමත් දෙසරයක් හිතන්නේ නැතිව බණ්ඩාරවෙලට මාරුවක් හදාගත්තා. ඒ වෙද්දී මම කොළඹ පශ්චාත් උපාධියකට සූදානම් වෙවී හිටියේ. ඒක අතඇරියා. ඒ වගේම පාස්අවුට් වෙන ලැයිස්තුවේ මම ඉහළින්ම හිටියා. ඒ නිසා මට ඕනම තැනකට යන්න පුළුවන්. හොඳ වෙලාවට බණ්ඩාරවෙල ඇබෑර්තුවකුත් තිබුණා. මම ගියා. එදා ඉඳන් 89 අවසන් භාගය වෙනකල් මම ඔවුන් සමග සමීපව හිටියා. විජේවීර සහෝදරයා එහේ ගෙවල් තුනක පදිංචි වෙලා හිටියා. එතකොට මොන දේට වුණත් මට තමයි පණිවිඩය එන්නේ.

එක දවසක් බණ්ඩාරවෙල ලෙව්ලෙගොඩ වත්තේ ඉන්නකොට පොලිසියෙන් පනිනවා ඒ ගෙදරට. ඇත්තටම පොලිසිය ඇවිත් තිබුණේ මල් හොයන්න. ඒ වත්තේ මැනේජර් විදියට තමයි රෝහණ සහෝදරයා හිටියේ. ඉතින් අපි දන්නේ නැහැ. මේ ආවේ මල් හොයන්න ද නැත්නම් ඔත්තුවකට ද කියලා. වහාම විජේවීර සහෝදරයා ඉවත් කරගත යුතුයි කියන තීරණයට ආවා. මගේ බිරිය ඒ වන විට සේවය කළේ දියතලාව රෝහලේ. ඇයගේ නිල නිවෙසට යන්න දියතලාව හමුදා කඳවුර මැදින් යායුතුයි. මම මගේ වාහනයේ විජේවීර සහෝදරයා, බිරිය හා දරුවන් දාගෙන ඒ නිල නිවාසයට ගියා. මගේ වාහනය පරීක්ෂා කරන්නේ නැහැනේ. ඉතින් සැලියුට් ගහල යන්න දෙනවා. දවස් දහයක් විතර ඒ නිල නිවාසෙ ඉඳල වෙන ආරක්ෂිත තැනකට යැව්වා.

අවසාන සමයෙදි දවසක් විජේවීර සහෝදරයාට කොළඹ එන්න ඕන වුණා. ඒ කාලෙ නම් ඉතාම නරක කාලයක්. එතකොට සාමාන්‍ය වේගයකින් අපේ වාහනය යනවා. ඉස්සරවෙලා යතුරුපැදි කිහිපයක් යනවා. ඒ යන යතුරුපැදියක් අනතුරක් තියේ නම් ආපසු එනවා. ඒ ආවාම අපි විකල්පයක් ගන්නවා. ඉතින් එක දවසක් යතුරුපැදියට ආපසු ඇවිත් පණිවිඩය දෙන්න බැරිවුණා. රත්නපුරේදි පොලිසියෙන් වාහනය නැවැත්වුවා. රියැදුරු මම. ඒ දවස්වල හොඳටම පරීක්ෂා කරනවා. වාහනේ දොරවල් ඇරලත් බැලුවා. විජේවීර සහෝදරයා ඔළුවෙ තුවායක් පොරවගෙන ඉන්නවා. මගේ වාහනයේ වෛද්‍යවරයෙක් බවට වන ලාංඡනයක් තියෙනවා. ඉතින් මම පොලිසියට කිව්වා මම අසවල් වෛද්‍යවරයා මේ ඉන්නේ මගේ නිල නිවෙසේ උයන කෙනා. එයාට සනීප නැහැ. වෛද්‍ය පරීක්ෂණ කිහිපයකට කොළඹ එක්ක යනවා කියලා. වාහනේ වෙපන් එකකුත් තිබුණා. ඒත් එදත් අපි බේරුණා."

ජවිපෙ නායකයා රැකගන්නට කළ ඔහුගේ කැපකිරීම් ඇඟ ලොමු ඩැහැගන්වනසුලුය. ජාතිකවාදී කඳවුරේ ප්‍රධාන භූමිකාවක් ක්‍රියාත්මක ඔහු අදත් විජේවීර මහතා සිහිපත් කරන්නේ භක්තියෙනි.

"මම අදත් බුදුන් වැඳල විජේවීර සහෝදරයටයි, සෝමවංශ සහෝදරයටයි පින් දෙනවා. මොකද ඔවුන් දෙදෙනා නොවන්නට අද මේ රට බෙදිලා සුඩානයේ වගේ බල්ලො බළල්ලු වගේ මරාගන්නවා. විජේවීර සහෝදරයා න්‍යායාත්මකව හරි දේ වෙනුවෙන් පෙනී සිටියා. 1979 දී ස්වයං තීරණ අයිතිය වෙනුවෙන් පක්ෂයේ කොටසක් පක්ෂව සිටියා. එතනදී ඔහු ලොකු සටනක් කළා. ලයනල් බෝපගේ සහෝදරයා තමයි ඒ ස්වයං තීරණ අයිතිය වෙනුවෙන් පෙනී හිටි කණ්ඩායමට නායකත්වය දුන්නේ. මම ඇත්තටම පෙනී හිටියේ බෝපගේ සහෝදරයාගේ මතය වෙනුවෙන්. මම ඔහුව පේරාදෙණි විශ්වවිද්‍යාලයට ගෙන්වලා ස්වයං තීරණ අයිතියට සහාය දෙන ලොකු රැලියක් කළා. 1980 දී විජේවීර සහෝදරයා ආවා විශ්වවිද්‍යාලයට. ඒ වෙලාවේ මම ඔහු එක්ක වාද කළා මේ ගැන. එතන දී විජේවීර සහෝදරයා කිව්වා ඒක න්‍යායාත්මකව වැරදියි. අනාගතයේ ඒ බව මම නිබන්ධනයකින් පෙන්වා දෙනවා කියලා. 1983 දී බෝපගේ සහෝදරයා ගැටුමක් හදාගෙන ඉවත්ව යනවා. ඇත්තටම විජේවීර සහෝදරයා කීව පොත ලියන්න ඔහුට පුළුවන් වෙන්නේ 1985 දී සැඟවී ඉන්නකොට. එහි ඉතා ශාස්ත්‍රීය ලෙස විග්‍රහ කරනවා එල්ටීටීඊය කියන්නේ කුලී හමුදාවක් මිස ලිබරේෂන් ආමි එකක් නෙවෙයි කියන එක. එතකොට ඔහු ඒ මඟපෙන්වීම කරල ඒ වෙනුවෙන් ජීවිතය දීපු නිසා තමයි 13 සංශෝධනය පූර්ණ ලිබරල් පාලනයක් ලෙස පිහිටුවන්න බැරි වෙන්නේ. ඇයි ජනමත විචාරණයකට යන්න බැහැනේ මේ විරෝධතා නිසා.

කොහොම වෙතත් 1994 දී අර කරපු පරිත්‍යාග කොයිතරම් බරපතළ ද කියනවා නම් සෝමවංශ සහෝදරයටත් ඒ මතයෙම ඉන්න වෙනවා. 2002 දී සටන් විරාම ගිවිසුම යටතේ තාවකාලික ආණ්ඩුවක් දෙන්න හදද්දී ජවිපෙ ඊට විරුද්ධව දැඩි මතයක ඉඳන් සටන් කළේ නැත්නම් 2002 දී රනිල් වික්‍රමසිංහ ඒ තාවකාලික ආණ්ඩුව දෙනවා. ඒ දුන්නනම් ඒත් රට සුඩානයක් වෙනවා. මේ නිසා අපේ රට විශාල විනාශයකින් ගලවගත්තු ගැලවුම්කරුවන් දෙදෙනකු සේ සලකා මේ දෙන්නට හැමදාම පින් දෙනවා. ඔවුන් දෙවියන් ලෙස මම සලකනවා. මේ රටේ ඉතිහාසය හරියට ලියැවෙන දවසක ඔවුන්ට ජනතාව දෙවියන්ට වගේ සලකාවි.

අද තියෙන ප්‍රශ්නය ඒ අතීත උරුමය පාවාදෙනවා ද කියන ප්‍රශ්නය මතුවෙන එක. ඩයස්පෝරාවට ඕන විදියට නටමින් රණවිරුවන් දඩයම් කරමින් මේ අය කරන්නේ පාවාදීමක් ද කියල හිතෙනවා.''

ඔහු එසේ කියන්නේ කලකිරීමක සේයාවක් මුවෙහි රඳවමිනි.

ඔහු පවසන පරිදි විජේවීර යනු අසහාය බුද්ධිමතෙකි. ජනතාවට ආදරය කරන ඔහු කිසිදු අවස්ථාවක ප්‍රචණ්ඩත්වයට අනුබල නොදුන්නේය.

''ඒ කාලෙ මතුවෙලා තිබුණ ප්‍රචණ්ඩත්වය ගැන වැඩියෙන්ම දුක්වුණ කෙනා ඔහුයි. කිසිදු මරණයක් ගැන සතුටින් කතා කළේ නැහැ. රටේ නිදහස වෙනුවෙන් කිසිදු ජීවිතයක් නැති කළ යුතු නැහැ කියලයි ඔහු කිව්වේ. ගුවන් හමුදාවේ ආයුධ උදුරගන්න ගිය වෙලාවේ සෙබළෙක් මැරුණා. ඒ වෙලාවේ ශෝකය ප්‍රකාශ කරල පෝස්ටර් ගැහුවා. ආණ්ඩුවේ ප්‍රචණ්ඩත්වය වර්ධනය වෙද්දී ඔහුට තමන්ගේ පැත්තෙන් ප්‍රචණ්ඩත්වය පාලනය කරන්න බැරිව ගියා. ලෝකයේ එවැනි සිද්ධි ගොඩක් උදාහරණ ලෙස තියෙනවා. එල් සැල්වදෝරය උදාහරණයක්. පක්ෂය තහනම් කරල කැළේට තල්ලු කරපු ජේ.ආර්. තමයි මේ සියල්ලට වගකිව යුතු. ප්‍රචණ්ඩත්වය යම් මාත්‍රාවකට පාවිච්චි කළ යුතුයි දේශපාලන ජයග්‍රහණ සඳහා කියලයි ඔහුගේ පැහැදිලි කිරීම. ඒ යම් මාත්‍රාව කියන එක ඉක්මවා යන්නේ ආණ්ඩුව විසින් දියත් කළ ප්‍රචණ්ඩත්වය නිසා. ඒ වෙද්දී ඝාතන කණ්ඩායම් 13ක් හිටියා. විවිධ නම්වලින් හිටි මේ පිරිස් වධකාගාර පවත්වාගෙන ගියා. සාමකාමී පෙළපාළියකට වෙඩි තියල 140ක් මැරුවා. රෝහණ විජේවීරට සමස්ත සමාජයම මෙහෙයවන්න බැරිව ගියා. වෛරය ගොඩනැගුවේ ආණ්ඩුව ඇතුළෙන්. එතකොට නායකත්වයේ පාලනයෙන් මිදෙනවා. ගරිල්ලා සංවිධානයකට එරෙහිව ආණ්ඩුව මේ වෛරය පවත්වාගෙන යද්දී ඊට වඩා සමාජයෙන් වෛරය මතුවෙනවා. ඒ වගේම විවිධ කල්ලි කණ්ඩායම් මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නවා. මේක විෂම චක්‍රයක් බවට පත්වෙනවා. මේ තත්ත්වය ගැන වැඩියෙන්ම දුක් වුණ කෙනෙක් රෝහණ සහෝදරයා.''

එතකොට 1971 කැරැල්ලෙදි ව්‍යාප්ත වුණ ප්‍රචණ්ඩත්වයත් විජේවීර සහෝදරයා ප්‍රතික්ෂේප කළාද?

"ඔව් ආණ්ඩුවට ප්‍රබල ලෙස මුහුණ දෙන්න ඕන කියන මතය පක්ෂය ඇතුළෙ තිබුණත් සිරගතව සිටි රෝහණ සහෝදරයා දැනුවත්ව නෙවෙයි ආයුධ අතට ගත්තේ. වෙනත් කණ්ඩායමක පෙළඹවීමටයි. ඒක ආරම්භ වුණාට පස්සේ පක්ෂය ඇතුළෙ ඒකට මුහුණ දෙන්න වෙනවා. ඇත්තටම විජේවීර සහෝදරයාගෙ නායකත්වය යටතේ ආරම්භ වුණ කැරැල්ලක් නෙවෙයි 71 කැරැල්ල."

ජනතා විමුක්ති පෙරමුණේ නායකයා කළ අවසන් ප්‍රකාශය නැවත නැවත ජාතියට ශ්‍රවණය කරන්නට දිය යුතු බව වෛද්‍ය වසන්ත බණ්ඩාරගේ මතයයි. ඔහු පවසන්නේ තමන් අසුවන බව දැන දැනත් ඔහු පලා නොගොස් රැඳුණේ අසුවූ මොහොතක ඝාතනය කරන බව නොදැන නොවන බවය. ඒ බව ඔහුගේ අවසන් ප්‍රකාශයෙන් පැහැදිලි බවත් ඔහු කියයි.

"ඔහුට තව ටික දවසක් ඉන්න තිබුණා. වටලන බව දැන දැනත් ඔහු ගියේ නැහැ. යන්න කියල පක්ෂයෙන් උපදෙස් දීල තිබියදී ඔහු එහෙම හිටියේ තවදුරටත් විනාශ වන පක්ෂයේ සාමාජිකත්වය රැකගන්නයි. ඒ වන විට සෝමවංශ සහෝදරයා ඔහුට බලකරමින් හිටියේ එතනින් ඉවත් වෙන්න කියලයි. මොකද තව දුර ගියොත් මර්දනය වළක්වන්න බැරි බව ඔහු ඒ වනවිට වටහාගෙන සිටියා. ඒ නිසයි ඔහු කිව්වේ ආපසු පාසලට යන්න වැඩබිමට යන්න කියල. මේ සිදුවන චක්‍රය වැළැක්විය යුතු බව ඔහු ඇදහුවා. ඔහු නොමියෙන මිනිසෙක්."

ඔහු කතාබහ අවසන් කරමින් කීවේය.

කොහොම වෙතත් 1994 දී අර කරපු පරිත්‍යාග කොයිතරම් බරපතළ ද කියනවා නම් සෝමවංශ සහෝදරයටත් ඒ මතයෙම ඉන්න වෙනවා. 2002 දී සටන් විරාම ගිවිසුම යටතේ තාවකාලික ආණ්ඩුවක් දෙන්න හදද්දී ජවිපෙ ඊට විරුද්ධව දැඩි මතයක ඉඳන් සටන් කළේ නැත්නම් 2002 දී රනිල් වික්‍රමසිංහ ඒ තාවකාලික ආණ්ඩුව දෙනවා.

විනීතා එම්. ගමගේ

උගතුන් රට හැර යෑම ලංකාවේ අනාගතය අඳුරට තල්ලු කරයිද?

රටක සංවර්ධනය සඳහා රටකට හිමි භෞතික සම්පත් ප්‍රමාණය, ප්‍රාග්ධන ශක්තිය හා මානව සම්පත බලපානු ලබයි. රටක භෞතික සම්පත් හා ප්‍රාග්ධන හැකියාව කෙතරම් ඉහළ මට්ටමක පැවතියද එහි මානව සම්පත දුර්වල නම් වේගවත් සංවර්ධනයක් කරා ළඟාවීමට හැකියාව නොලැබේ.

ශ්‍රී ලංකාව මෑත කාලීනව මුහුණ දෙන දරුණුතම අභියෝග අතරින් එකක් ලෙස බුද්ධිගලනය නොහොත් දක්ෂ වෘත්තිකයන් මෙරට හැර යෑම දැක්විය හැකිය. මෑත කාලීනව සිදු වූ ආර්ථික කඩා වැටීම් දේශපාලන අස්ථාවරත්වය සහ ආදායමට සාපේක්ෂව ජීවන වියදම ඉහළ යෑම හමුවේ නිදහස් අධ්‍යාපනයෙන් උපරිම ඵල ලැබූ වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, මහාචාර්යවරුන් සහ තොරතුරු තාක්ෂණ විශේෂඥයන් ආදී උගතුන් රට හැර යෑමට තීරණය කරති. මෙය සමස්ත ශ්‍රී ලංකාවේම අනාගතය උඩුයටිකුරු කළ හැකි දීර්ඝ කාලීන ව්‍යසනයකි. මෙවැනි රටට අවශ්‍ය පුද්ගලයන් රටින් පිටවීමට උත්සාහ දැරීම හුදෙක්ම ඉහළ වැටුපක් අපේක්ෂා කිරීමෙන් ඔබ්බට ගිය සංකීර්ණ හේතු සමූහයක ප්‍රතිඵලයකි. එහි ප්‍රධානතම හේතුවක් වන්නේ තම වෘත්තීය දැනුමට හා කැපවීමට සරිලන ආර්ථික ඇගයීමක් රට තුළ නොමැති වීමයි. එසේම රාජ්‍ය සේවකයන්ට වුවද ඉහළ උද්ධමනයක අධික බදුබර හමුවේ සිය පවුල් නඩත්තු කිරීමටද අපහසු වී ඇත. එසේම මෙවැනි අයවලුන් විදේශගතවීමට තවත් ප්‍රබල හේතුවක් වී ඇත්තේ රට තුළ දේශපාලන හා ප්‍රතිපත්තිමය අස්ථාවරත්වය හේතුවෙන් අනාගතය පිළිබඳව ඇති අවිනිශ්චිතතාවයයි.

එසේම මෙරට වෘත්තීය වර්ධනයට ඇති සීමා සහ නවෝත්පාදනය සඳහා ඇති අඩු පහසුකම් හේතුවෙන් ද ඔවුන් විදේශයන්හි වඩා හොඳ අවස්ථා සොයා යාමට පොලඹවයි. එහිදී ඔවුන් දකිනුයේ තම දරුවන්ට සුරක්ෂිත ස්ථාවර සහ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දිය හැකි විදේශීය පරිසරයකි.

මෙලෙස දක්ෂ මෙන්ම රටට අවැසි පුද්ගලයන් රට හැර යෑම ශ්‍රී ලංකාවේ අනාගතය කෙරෙහි බරපතළ ලෙස බලපෑම් ඇති කරනු ලබයි. එහිදී අත්‍යවශ්‍ය සේවාවල බිඳවැටීම් දැකිය හැකිය. එනම් රටේ විවිධ ක්ෂේත්‍රවල අත්දැකීම් බහුල වෘත්තිකයන් ගණනාවක් රට හැර යෑම තුළින් ඔවුන්ගෙන් සේවයේ අත්‍යවශ්‍ය සෑම අංශයකම ඉදිරි ගමනට බාධා ඇති වීම සිදුවේ. එහිදී රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් සලසන ව්‍යාපාර, අධ්‍යාපනය, සෞඛ්‍ය, ඉදිකිරීම්, බලශක්ති සහ ප්‍රවාහනය වැනි අංශ ගණනාවක දැනටමත් පුහුණු හා අත්දැකීම් බහුල වෘත්තිකයන්ගේ හිඟයක් පැවතීම දැකිය හැකිය.

මෙලෙස අප රටේ ශ්‍රම බළකාය සංකෝචනය වීමෙන් රටේ ආර්ථික වර්ධන වේගය අඩාළ වීමක් ද සිදු වේ. එසේම රට තුළ නිෂ්පාදන අඩු වීමෙන් රටේ අපනයනය අඩුවී ආර්ථික ක්ෂේත්‍රයේ දැවැන්ත කඩා වැටීමකට වුවද භාජනය වීමට හැකියි.

කාලාන්තරයක් තිස්සේ සිදු වන රටට අවැසි ශ්‍රම බළකායේ රට හැරයෑම අඩු කිරීමට නම් රට තුළ සැබවින්ම ව්‍යුහාත්මක වෙනසක් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. එහිදී ප්‍රධාන වශයෙන් වෙළෙඳාම් කටයුතු ලිබරල්කරණය පුළුල් කිරීම හා එය නියාමනයට අවශ්‍ය නීති රීති සම්පාදනය කිරීම, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා පර්යේෂකයන්ට අවශ්‍ය පහසුකම් සහ මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම, ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල් සමග සම්බන්ධතා ඇති කර ගැනීම ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා සිදුකළ යුතුය. එසේම ඉහළ පරිපාලන තනතුරු සඳහා දක්ෂ තරුණ තරුණියන් පත් කර ගැනීම සිදු කළ යුතුය.

එසේම ඉහළ යන උද්ධමනය පාලනයට ජාතික ඵලදායිතාවය ඉහළ නැංවීමට අවශ්‍ය උපාය මාර්ග සකස් කිරීම මෙන්ම ලාංකිකයන්ට ලංකාවේ සිටම ඩොලර්වලින් වැටුප් ලැබිය හැකි ජාත්‍යන්තර මට්ටමේ වූ රැකියාවන්හි ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීමද සිදු කළ යුතුය.

මෙම වෙනස්කම් කඩිනමින් සිදුකිරීම තුළින් රටේ රැකියා උත්පාදනය ඉහළ යෑම සිදු වී කාලයත් සමග රටේ සිදුවන බුද්ධිගලන වේගය අඩු කර ගත හැකිය. එය එක් දිනකින් සිදු කළ හැකි අරුමයක් නොවන බැවින් ශ්‍රී ලංකාව නව නිපැයීම් සිදුකරන සංවර්ධිත සෞභාග්‍යමත් දේශයක් බවට පත් කිරීමට නම් පාලකයන් සහ නීති ක්‍රියාත්මක කරන්නන් සැවොම එකට එකාවන්ව එක්ව රටේ අනාගතය උදෙසා ක්‍රියා කළ යුතුය.

වාසනා ලක්ෂානි